ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් ලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணி செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்லை.
"Mihikatha Medura", Land Secretriat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
Fax 011 286 4051

මගේ අංකය / எனது இல / My No }
ඔබේ අංකය / உமது இல / Your No }

08 SEP 2020

දිනය / திகதி / Date } 2020.09.07

චක්‍රලේඛ අංක: 2020/17

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්

ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)

**දේශීය ආහාර බෝග නිෂ්පාදනය සහ සත්ව ආහාර වගාවන් සඳහා රජයේ ඉඩම් යොදා ගැනීම**

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව දේශීය ආහාර බෝග නිෂ්පාදනය හා කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා රජයේ අවධානය යොමු වී ඇත. කෘෂිකාර්මික වශයෙන් ස්වයංපෝෂිත ආර්ථිකයක් බිහිකිරීම තුළින් ආනයන සීමා කිරීමත්, අගය එකතු කරන ලද කෘෂි නිෂ්පාදන අපනයන කිරීමත් තුළින් දේශීය ආර්ථික වර්ධන ඉලක්ක කරා ළඟා වීමට රජයේ ඉඩම් ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා වූ ක්‍රමවේද සකස් කරමින් රජයේ ඉඩම් ගොවීන් ලවා වගා කරවීම දිරිමත් කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

01. කෘෂිකාර්මික කටයුතු සඳහා විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ බැහැර කර ඇති ඉඩම්

කෘෂිකාර්මික කටයුතු සඳහා විධිමත් ක්‍රමවේදයකට අනුව, දීමනාපත්‍ර/ බලපත්‍ර/ වාර්ෂික අවසර පත්‍ර/ දීර්ඝකාලීන බදු මත බැහැර කර ඇති බොහොමයක් ඉඩම් පූර්ණ වශයෙන් පරිහරණයට යොදාගෙන නොමැති බව නිරීක්ෂණය වී ඇත. එබැවින් එම ඉඩම්වල ඵලදායිතාවය වැඩි කරමින්, ඉඩම් පූර්ණ වශයෙන් වගා කටයුතු සඳහා යොදා ගන්නා ලෙස ක්ෂේත්‍ර නිලධාරීන් මගින් ඉඩම්ලාභීන් දැනුවත් කර ඊට අදාළ තොරතුරු පද්ධතියක් සකස් කරන්න. මෙම තොරතුරු පද්ධතියේ මෘදු පිටපතක් පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්ට පිටපතක් සහිතව info@landcom.gov.lk දරණ විද්‍යුත් තැපැල් ලිපිනයට එවන්න. මේ පිළිබඳ නිරන්තර පසු විපරමක් සිදුකළ යුතු අතර, වගා කටයුතු නොකෙරෙන ඉඩම් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට සිදු වන බව අවධාරණය කරන්න.

02. අවිධිමත් ඉඩම් පරිහරණය විධිමත් කිරීම

දැනටමත් රජයේ ඉඩම්, අවිධිමත්ව වගා කටයුතු සඳහා පරිහරණය කරන්නන්ට මාගේ 2020/16 චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විධිමත්ව අදාළ ලියවිලි ලබාදීමට කටයුතු කරන්න.



Scanned by CamScanner

## 03. කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගත හැකි රජයේ ඉඩම් හඳුනා ගැනීම.

### I. සුදුසු රජයේ ඉඩම් හඳුනා ගැනීම.

මාගේ 2020/16 චක්‍රලේඛය මගින් ආවරණය වන ස්ථිර බෝග වගාවක ස්ථිර සංවර්ධනය සිදුකර ඇති ඉඩම් මෙම ක්‍රමවේදය ඔස්සේ වගා කිරීම සඳහා ලබාදීමට හඳුනා නොගත යුතුය. දැනටමත් විධිමත් ක්‍රමවේදයක් තුළින් බෙදා දී නොමැති හා ස්ථිර වගාවන් රහිත මෙම චක්‍රලේඛයේ අරමුණු සඳහා යොදාගත හැකි අනෙකුත් රජයේ ඉඩම් සහ ඌන උපයෝජිත රජයේ ඉඩම් පමණක් මෙම ක්‍රමවේදය ඔස්සේ වගා කිරීම සඳහා යොදාගත හැකිය. එබැවින් ග්‍රාම නිලධාරී වසම මට්ටමින් එවැනි ඉඩම් හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. රජයේ ඉඩම් සහ ඌන උපයෝජිත රජයේ ඉඩම්වලින් වගා කළ හැකි රජයේ ඉඩම් හඳුනාගැනීම ඉඩම් පරිහරණ කමිටුව මගින් සිදු කළ යුතුය. ඉඩම් පරිහරණ කමිටුව මගින් වගාව සඳහා යොදාගැනීමට සුදුසු ලෙස හඳුනාගත් ඉඩම් සම්බන්ධයෙන් ලැයිස්තුවක් පිළියෙල කිරීමට කටයුතු කරන්න. මෙහිදී ක්ෂේත්‍ර නිලධාරීන් සතුව ඇති ටැබ් යන්ත්‍ර භාවිතයෙන් ඉඩමේ දළ මැනුමක් සිදුකිරීමට හැකියාවක් ඇති අතර, ඉඩමේ ප්‍රමාණය හා මායිම් තොරතුරු ද අදාළ ලේඛනයට ඇතුළත් කරන්න.

මෙසේ වගා කිරීම සඳහා හඳුනා ගන්නා ලද ඉඩම් කුමන වගාවක් සඳහා යෝග්‍ය වන්නේ ද යන්න ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් නිලධාරීන්, ගොවිජන සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම නිලධාරීන්, අපනයන කෘෂිකර්ම නිලධාරීන් හා අදාළ අනෙකුත් නිලධාරීන් මගින් තොරතුරු ලබාගෙන ලේඛනගත කිරීමට කටයුතු කරන්න. වගා කිරීමට සුදුසු බෝගය හඳුනා ගැනීමේදී ආර්ථික පුනර්ජීවන හා දිළිඳුකම පිටුදැකීම සඳහා වූ ජනාධිපති විශේෂ කාර්ය සාධක බලකාය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත දේශීය ආහාර බෝගයන් වන කවුපි, මුං ඇට, රටකජු, මිරිස්, ළූණු, කුරක්කන්, කොල්ලු, රතුළූණු, ලොකුළූණු, තල, කහ, ඉඟුරු, අර්තාපල්, සෝයා බෝංචි සහ බෝග වර්ග හා සත්ව ආහාර සඳහා බඩඉරිඟු වගාකිරීම සඳහා යොදා ගැනීමට කටයුතු කරන්න. මෙම තොරතුරු ඇතුළත් කර සකස් කර ගන්නා මෙම ලේඛනයේ මෘදු පිටපතක් පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්ට පිටපතක් සහිතව info@landcom.gov.lk දරණ විද්‍යුත් තැපැල් ලිපිනයට එවන්න.

### II. වගාකරුවන් තෝරා ගැනීම.

මෙම ඉඩම් වගා කිරීම සඳහා සුදුසු වගාකරුවන් තෝරා ගැනීමේ කාර්යය, මෙම චක්‍රලේඛයේ සඳහන් සීමාවන්ට යටත්ව ඉඩම් පරිහරණ කමිටුවේ එකඟතාවයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් සිදුකළ යුතුය. එහිදී, ඉහත අංක 03 (I) හි හඳුනාගත් ඉඩම්, වගා කිරීම සඳහා හැකියාවක් සහ ලැදියාවක් ඇති ප්‍රදේශයේ වගාකරුවන් අතරින් සුදුසුකම් ලත් පුද්ගලයන් හඳුනාගෙන එවැනි වගාකරුවන් ලියාපදිංචි කරවීමට කටයුතු කරන්න. ඒ සඳහා මෙම චක්‍රලේඛයේ ඇමුණුම 01 මගින් හඳුන්වා දී ඇති ආකාරයේ අයදුම්පත්‍රයක් මගින් තොරතුරු ලබාගන්න. මෙම වැඩසටහන පිළිබඳ ග්‍රාම නිලධාරීවරුන්, කෘෂිකර්ම නිලධාරීන්, අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් හා ස්වේච්ඡා සංවිධානවල නියෝජිතයන් හරහා වගාකරුවන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

Scanned by CamScanner

යම්කිසි ඉඩමක් වගා කිරීම සඳහා එක් වගාකරුවෙකුට වැඩි වගාකරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වන අවස්ථාවලදී විධිමත් තෝරා ගැනීමක් යටතේ විනිවිදභාවය ආරක්ෂා වන පරිදි සුදුසු පුද්ගලයා හඳුනා ගැනීමට කටයුතු කරන්න. එහිදී බෝගය වගා කිරීම සඳහා ඉල්ලුම්කරු සතුව ඇති දැනුම, පළපුරුද්ද, මූල්‍ය ශක්තිය, කායික යෝග්‍යතාවය, මානව හා භෞතික සම්පත් හිමිකම් ආදිය හා හැකියාව සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට ලබා දීමට කටයුතු කරන්න.

මෙම ක්‍රමවේදයේ අරමුණ වන්නේ රජයේ ඉඩම් සහ ඌන උපයෝජිත රජයේ ඉඩම ඵලදායීව වගා කිරීම තුළින් දේශීය ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම හා සත්ත්ව ආහාර නිෂ්පාදනය වැඩි කිරීම මිස, ඉඩම් නොමැති අයට ඉඩම් බෙදා දීමේ ක්‍රමයක් නොවන බව අවධාරණය කරමි. එබැවින් සුදුසු වගාකරුවන් හඳුනා ගැනීමේදී මෙම වැඩ සටහනේ අරමුණ සාක්ෂාත් කරගත හැකිවන පරිදි වගාකරුවන් හඳුනා ගැනීමට කටයුතු කරන්න.

යම්කිසි ඉඩමක්, වගා කිරීම සඳහා පුද්ගලයන් කිහිපදෙනෙකු අතර ලබාදිය හැක්කේ භූමියෙන් ලබාගත හැකි උපරිම ඵලදායීතාවය ලබාගැනීමට හැකි නම් පමණි. එබැවින් ඉඩම කොටස් වීම වළක්වා ගැනීම සඳහා සුදුසු පියවර අනුගමනය කළ යුතු අතර ඉඩම කොටස් කිරීමට අත්‍යවශ්‍ය වන්නේ නම් පමණක් අවම බෙදුම් සීමාව අක්කර ½ ලෙස සහ උපරිමය අක්කර 03 ලෙස පවත්වා ගැනීම කළ යුතුය. ප්‍රදේශයේ පවතින ඉඩම් සුලභත්වය අනුව මෙම සීමාවට යටත්ව වගාව සඳහා ලබාදෙන ඉඩම් ප්‍රමාණය තීරණය කිරීමට හැකියාව ඇත.

## III. වගාව සඳහා ඉඩම් ලබාදෙන ක්‍රමවේදය

මෙම ඉඩම් වගාව සඳහා ලබාදීමේ අරමුණ වන්නේ සුදුසු වගාකරුවන් ලවා රජයේ ඉඩම් සහ ඌන උපයෝජිත රජයේ ඉඩම් වගාකර ගැනීම බැවින් වගාකරුවන් වෙත රජයේ ඉඩමට ප්‍රවිෂ්ට වී වගා කටයුතුවල නිරතවීමට පමණක් අවසරය ලබාදිය යුතු බව අවධාරණය කරමි. එබැවින් මෙම ඉඩම කවදුරටත් බැහැර නොකරන ලද රජයේ ඉඩම් ලෙස හඳුනාගත යුතුය. මෙය වගාකරුවන්ට කිසිසේත්ම ඉඩම පිළිබඳ අයිතිවාසිකම් ප්‍රකාශ කිරීමට ලැබෙන හිමිකමක් සේ නොසැලකිය යුතුය. වාර්ෂිකව ඉඩම් පරිහරණය කරනු ලබන ආකාරය පිළිබඳ ක්ෂේත්‍ර වාර්තාවක් ලබාගෙන, ඉඩම් නිලධාරි නිර්දේශ සලකා ඉඩමට ප්‍රවිෂ්ට වීමේ අවසරය වාර්ෂිකව සමාලෝචනය කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සිදු කළ යුතු වේ. එසේම මරණය හෝ වෙනත් ඕනෑම හේතුවක් මත යම්කිසි වගාකරුවකු, වගාකිරීම සඳහා නුසුදුසු අයකු වන්නේ නම් වෙනත් අයෙකුට එම ඉඩම වගාකිරීම සඳහා ලබා දීමට ප්‍රාදේශීය ලේකම්ට හැකියාව ඇත.

ඉඩමට ප්‍රවිෂ්ට වීමේ අවසරය ලබාදුන් දිනයේ සිට මසක් ඇතුළත බෝග වගාකිරීම ආරම්භ කළයුතු අතර, එසේ කිරීමට අපොහොසත් වන වගාකරුවන්ගේ වගා අවසරය ඒකපාර්ශවීයව අවලංගුකර එම ඉඩම සඳහා සුදුසු වෙනත් වගාකරුවෙකු හඳුනා ගැනීමට ප්‍රාදේශීය ලේකම්ට හැකියාව ඇත. මෙම වගා ඉඩම තුළ කිසිදු ස්ථිර ඉදිකිරීමක් සිදු කිරීමට අවසර ලබා නොදිය යුතුය. වගාකරුවන් රජයේ අවශ්‍යතාවය අනුව වගා කටයුතු සිදු කරන බවට සහතික වාර්තාවක් ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් ලබා ගැනීමට කටයුතු කරන්න. මෙම වගා ඉඩම සඳහා කිසිසේත් ස්ථිර වැට මායිම් සකස් නොකළ යුතු අතර වගාවේ ආරක්ෂාව සඳහා ජීව වැටවල් සකස් කිරීමට වගාකරුවන් දැනුවත් කරන්න.

Scanned by CamScanner

වගාකරුවන්ට වගා ඉඩමට ප්‍රවිෂ්ට වී වගා කිරීම සඳහා අවසරය ලබාදීමට මා විසින් මේ සමඟ ඇමුණුම 02 මගින් හඳුන්වාදෙනු ලබන ආකෘතියෙන් වූ ලේඛනය භාවිතා කරන්න. එම වගා අවසරය විධිමත්ව ප්‍රාදේශීය ලේකම් හා වගාකරු දෙදෙනාම පිටපත් 04කින් යුක්තව අත්සන් කළ යුතු අතර, පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් වෙත පිටපතක් සහිතව එක් පිටපතක් මා වෙත එවීමට කටයුතු කරන්න.

## IV. වගාකරුවන් සඳහා පහසුකම් සැලසීම

දැනට ක්‍රියාත්මක රාජ්‍ය යාන්ත්‍රණය ඔස්සේ අවශ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා වගාකරුවන් දැනුවත් කළ යුතුය. එක් එක් ඉඩම වගා කිරීමට යෝජිත බෝගයේ ස්වභාවය අනුව තාක්ෂණික දැනුම හා අදාළ පහසුකම් ලබාගත හැකි රාජ්‍ය ආයතන හා වගාකරුවන් සම්බන්ධීකරණය ඉඩම් පරිහරණ කමිටුව හරහා සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන්න. වගා කටයුතු සිදු කිරීමේදී ජල පහසුකම් ලබා ගැනීම සඳහා තාවකාලික වගා ළිං ඉදිකිරීම වැනි වගාව සඳහා අවශ්‍ය පහසුකම් සපයා ගැනීම අවශ්‍ය වූ විට ඉඩම් පරිහරණ කමිටුවේ එකඟතාවයෙන් අදාළ කටයුතු කළ හැකිය.

එසේම වගා කටයුතු කිරීමේදී ඔවුන්ට මූල්‍ය පහසුකම් ලබාගැනීමට අවශ්‍ය යැයි ඉල්ලා සිටියහොත්: දැනට රජය විසින් හඳුන්වා දී ඇති සහන ණය ලබා ගැනීමට හැකි වනු පිණිස වගා කිරීම සඳහා ඉඩම වෙන් කර දී ඇති බව සඳහන් කර ඉඩමට ප්‍රවිශ්ඨ වීමේ අවසරයේ පිටපතක් සමඟ ලිපියක් අදාළ බැංකුව වෙත යොමු කරන්න. සමෘද්ධි සංවර්ධන බැංකු, ගොවිජන සංවර්ධන බැංකු වැනි මූල්‍ය ආයතන මගින් අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා වගාකරුවන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

## V. නියාමනය හා සම්බන්ධීකරණය

මෙම ඉඩම් වගාව සඳහා ලබාදීමේ ක්‍රියාවලිය දිවයින පුරා ඒකාකාරී පොදු ක්‍රමවේදයකට සිදුකිරීම අත්‍යවශ්‍ය බැවින් මේ සමඟ ඇති ඇමුණුම 03 මගින් හඳුන්වා දී ඇති වැඩපියවර අනුගමනය කරන්න. එක් එක් පියවර අවසානයේ දී එහි ප්‍රගතිය පිළිබඳව වාර්තාවේ මෘදු පිටපතක් දිස්ත්‍රික් ලේකම්, පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්ට පිටපතක් සහිතව info@landcom.gov.lk දරණ විද්‍යුත් තැපැල් ලිපිනයට එවන්න. දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රගතිය අධ්‍යයනය කර සාරාංශගත වාර්තාවක් පිළියෙල කරනු ඇත. එහි පිටපතක් ලබාගෙන මෙම චක්‍රලේඛය අනුව මේ සඳහා වෙනම ගොනු පද්ධතියක් පවත්වා ගත යුතු අතර මෙම චක්‍රලේඛයේ ඇමුණුම 04 මගින් හඳුන්වා දී ඇති ආකාරයට MS Excel පරිගණක දත්ත පද්ධතියක් සකස් කර යාවත්කාලීන කරමින් පවත්වාගත යුතුය.

Scanned by CamScanner

රජයේ ඉඩම් සහ ඌන උපයෝජිත රජයේ ඉඩම් සුදුසු වගාකරුවන් ලවා අස්වැද්දා ගැනීම තුළින් දේශීය ආහාර සුරක්ෂිතතාවය තහවුරු වන්නා සේම වගාකරුවන්ට ආර්ථික ප්‍රතිලාභ ද හිමි වේ. එබැවින් ඒ පිළිබඳ වගාකරුවන් දැනුවත්කර දේශීය වගාකරුවන්ගේ උද්‍යෝගය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේ දී යම් ගැටලුවක් වේනම් මා විමසන්න.

ආර්.එම්.සී.එම්. හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:-

| | |
|---|---|
| 1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය | දැ.ගැ.ස. |
| 2. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය | |
| 3. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | |
| 4. ලේකම්, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය | |
| 5. සියලුම දිස්ත්‍රික් ලේකම්වරු | දැ.ගැ.ස. සහ අ.ක.ස. |
| 6. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| 7. අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| 8. කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | |
| 9. වන සංරක්ෂණ ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | |
| 10. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සම්පත් සංරක්ෂණ දෙපාර්තමේන්තුව | |
| 11. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | |
| 12. සර්වේයර් ජනරාල්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව | |
| 13. අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන අධිකාරිය | |
| 14. විගණකාධිපති, රජයේ විගණන කාර්යාලය | දැ.ගැ.ස. |
| 15. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | දැ.ගැ.ස. සහ අ.ක.ස. |
| 16. ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දිළිඳුකම පිටුදැකීම සඳහා වූ විශේෂ කාර්ය සාධන බලකාය | දැ.ගැ.ස. |